# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,571 — 1965 නොවැම්බර් 27 වැනි සෙනසුරාද — 1965.11.27**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී.)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## මිළ පාලන දූත්වීම

### මිළ පාලන පනත

### ආඥාව

(173 වැනි අධිකාරය වන) මිල පැලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර (විවිධ ද්‍රව්‍ය) මිල පාලක, බුහනෙකබාහු පියංගේ වික්ටර් ඇලෙක්සැන්ඩර් ජස්ටින් පූර්ණවන්ස සේනාරත්න, වන මම, පහත සඳහන් පරිදි මෙයින් අණ කරමි :—

1. මේ ආඥාව 1965 අංක 1 දරන (කපු මහන නූල්—සුදු) මිල පාලන ආඥාව යනුවෙන් හැඳින්විය හැකිය.

2. මේ ආඥාව මුළු දිවයිනටම අදල විය යුතුය.

3. මෙයට යාකොට ඇති උපලේඛනයේ 2, 3 සහ 4 වැනි තීරයන්හි ඇති එක් එක් සටහනෙහි නියමකොට දක්වා ඇති මිල ගණන් පිළිවෙලින් ආනයනිකයාගේ උපරිම තොග මිල, තොග වෙළෙන්දාගේ උපරිම තොග මිල හා සිල්ලර වෙළෙන්දා පාරිභෝගිකයාගෙන් අයකළ යුතු උපරිම සිල්ලර මිල විය යුතු අතර, ඒ උපලේඛනයේ 1 වැනි තීරයෙහි අනුරූප සටහනෙහි විස්තරකොට දක්වා ඇති කපු මහන නූල් (සුදු) කිසිවක් ඒ මිල ගණන්වලට වඩා ඉහළ මිල ගණන්වලට නොවිකිණිය යුතුය.

4. (1) මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි නියමකොට දක්වා ඇති භාණ්ඩයකින් යම් ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා වෙළෙන්දෙකුට විකිණීම හෝ ඒ උපලේඛනයේ 1 වැනි තීරයෙහි නියමකොට දක්වා ඇති භාණ්ඩයකින් වරකට දූසිම් දෙකකට නොඅඩු යම් ප්‍රමාණයක් විකිණීම තොග වෙළඳාමක් වශයෙන් කැරෙන විකිණීමක් ලෙස සැලකිය යුතුය.

(2) මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි නියමකොට දක්වා ඇති භාණ්ඩයකින් පාරිභෝගය හෝ ප්‍රයෝජනය සඳහා දූසිම් දෙකකට වඩා අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලරට විකිණීමක් වශයෙන් සැලකිය යුතුය.

5. මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි නියමකොට දක්වා ඇති කපු මහන නූල් (සුදු) කිසිවක් විකිණීම සඳහා යම් ස්ථානයක හෝ යම් වාහනයක තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ ඇති සෑම වෙළෙන්දකු විසින්ම, ඒ කපු මහන නූල් (සුදු) වර්ගය ද උසින් අඟලකට නොඅඩු ඉලක්කම් වලින් මේ ආඥාවෙන් කපු මහන නූල් (සුදු) සඳහා නියමකර ඇති උපරිම මිල ද යම් ගනුදෙනු කරුවෙකුට පැහැදිලිවම දකගත හැකි පරිදි දක්විය යුතු දැන්වීමක් ඒ ස්ථානයෙහි හෝ ඒ වාහනයෙහි ප්‍රකටව පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතුය.

6. කපු මහන නූල් (සුදු) කිසිවක් තොග වශයෙන් හෝ සිල්ලරට විකුණන සෑම තැනැත්තකු විසින් ම—

(අ) විකිණීම සිදුකළ දිනය ;

(ආ) විකුණූ කපු මහන නූල් (සුදු) පිළිබඳ විස්තරය හා විකුණූ ප්‍රමාණය ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා අයකළ මිල ; සහ

(ඈ) ඒ ගනුදෙනුවේ ස්වභාවය එනම්, ඒ විකිණීම කරන ලද්දේ තොග වෙළඳාමක් වශයෙන් ද නැතහොත් සිල්ලර වෙළඳාමක් වශයෙන්ද යන වග ;

දක්වා තිබිය යුතු කුවිතාන්සියක් ගැණුම්කරුට දිය යුතු ය.

7. මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි නියමකොට දක්වා ඇති යම් කපු මහන නූල් (සුදු) ආනයනිකයකු හෝ තොග හෝ සිල්ලර වෙළෙන්දෙකු වශයෙන් ව්‍යාපාරයෙහි යෙදී සිටින සෑම තැනැත්තකු විසින් ම, ඒ ව්‍යාපාරය කරගෙන යනු ලබන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිල පාලක වෙත 1965 දෙසැම්බර් මස 11 වැනි දින මධ්‍යාහ්න 12 නොඉක්මවා පහත සඳහන් කරුණු දක්වෙන වාර්තාවක් සැපයිය යුතුය :—

(අ) ඒ වාර්තාව පිළියෙළ කරනු ලබන අවස්ථාවේදී තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ ඇති කපු මහන නූල් (සුදු) තොග ප්‍රමාණය ; සහ

(ආ) ඒ තොග තබා ඇති එක් එක් ගබඩාව හෝ සෙසු ස්ථානය.

තවද,

8. මෙයට යාකොට ඇති උපලේඛනයේ 2, 3 හා 4 වැනි තීරයන්හි නියම කොට දක්වා ඇති උපරිම මිලට, ඒ කපු මහන නූල් (සුදු) විකුණනු ලැබෙන අවස්ථාවේදී ඒවා යම් දෙයකින් ඔතා තිබෙ නම් හෝ ඒවා යම් බඳුනක බහා තිබෙ නම් ඒ ඔතනයේ හෝ ඒ බඳුනේ මිල ඇතුළත් විය යුතුය.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
මිල පාලක (විවිධ ද්‍රව්‍ය).

1965 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ 3, වාණිජ දෙපාර්තමේන්තුවේදී ය.

1669——ආර් 10617—9,250 (65/11)

උපලේඛනය

| තීරය 1 | | තීරය 2 | තීරය 3 | තීරය 4 |
|---|---|---|---|---|
| කපු මහන නූල් (සුදු) | | දුසිමකට ආනයනිකයාගේ උපරිම තොග මිල | දුසිමකට තොග වෙළෙන්දාගේ උපරිම තොග මිල | එකකයකට සිල්ලර වෙළෙන්දාගේ උපරිම සිල්ලර මිල |
| වර්ගය | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ඇන්කර් (ක්ලාක්ස්) ඉඟුන් 2/27 | —නො. 40 හා 50 (බෝල) | 1 12 | 1 23 | 0 12 |
| ඇන්කර් (ක්ලාක්ස්) යාර 6/200 | —නො. 10 හා 12 (රෝද) | 10 55 | 11 61 | 1 11 |
| ඇන්කර් (ක්ලාක්ස්) යාර 6/200 | —නො. 16 සහ ඉන් වැඩි (රෝද) | 7 40 | 8 14 | 0 78 |
| බ්‍රැට්ස්ලාවා යාර 4/200 | —නො. 40 (රෝද) | 3 52 | 3 87 | 0 37 |
| බ්‍රිජ් යාර 3/500 | —නො. 40 (බීරළු) | 2 80 | 3 8 | 0 30 |
| කව් යාර 500 | —නො. 40 (ටියුබ්) | 3 19 | 3 51 | 0 34 |
| ක්‍රොස් යාර 2/500 | —නො. 40 (ටියුබ්) | 2 76 | 3 4 | 0 29 |
| ඊගල් යාර 500 | —නො. 40 (ටියුබ්) | 2 80 | 3 8 | 0 30 |
| ප්ලයිං වීල් යාර 3/500 | —නො. 40 (කොප්) | 4 82 | 5 30 | 0 51 |
| ජෝකර් ඇන්ඩ් බෙල් යාර 2/500 | —නො. 40 (ටියුබ්) | 2 86 | 3 15 | 0 31 |
| කැන්ගරු යාර 500 | —නො. 40 (ටියුබ්) | 3 0 | 3 30 | 0 32 |
| කොහිනූර් යාර 2/500 | —නො. 40 (බීරළු) | 5 33 | 5 86 | 0 56 |
| ලෙටර් (කෝට්ස්) යාර 3/200 | —නො. 40 (රෝද) | 4 14 | 4 56 | 0 44 |
| 2 පාරි යාර 500 | —නො. 40 (ටියුබ්) | 3 19 | 3 51 | 0 34 |
| රෙඩ් හාට් (කෝට්ස්) යාර 2/500 | —නො. 40 (කොප්) | 3 96 | 4 36 | 0 42 |
| වයලින් යාර 2/500 | —නො. 40 (කොප්) | 3 88 | 4 27 | 0 41 |

සටහන :—මේ මිළ ගණන් වූ කලී ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ ගණන් නොවේ. ඒවා උපරිම මිළ ගණන් වන අතර, ඒ මිළ ගණන් වලට වැඩි මිළ ගණන්වලට විකිණීම නොකළ යුතුය.

11–89

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රේගු නිවේදනය අංක 61/9/209

ආදයම් රක්ෂණ ආඥාපනත (235 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1965 නොවැම්බර් මස 29 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... ... | 1 5 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... ... | 0 7 |

අංක ඒ. 751.
1965 නොවැම්බර් මස 27 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

සී. නාරායනසාමි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

11–91

## රේගු දැන්වීම අංක 64/5/69

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරණ ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡේදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 නොවැම්බර් මස 29 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිළිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 215 9/10 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 286 43 | 278 57 | 236 57 | 71 61 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

අංක ඒ. 744/22,
1965 නොවැම්බර් මස 27 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

සී. නාරායනසාමි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

11–92

ලංකාවේ වැලවේගෙයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.